සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

හින්දු ධර්මය I
இந்து சமயம் I
Hinduism I

42 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදු** දක්වන්න.

● අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළව කරුණු **පහ** බැගින් දී ඇත. ඒවායින් **එකක්** කුමක් හෝ හේතුවක් මත අනෙකුත් ඒවා සමග නොගැළපේ. එම **නොගැළපෙන** කරුණ තෝරන්න.

1. (1) කර්ෂණම් (2) ප්‍රදිට්ටෛ (3) අන්දියේට්ටි
   (4) උත්සවම් (5) ප්‍රායචිත්තම්

2. (1) ප්‍රකාමියම් (2) ප්‍රාණායාමම් (3) තාරණෛ
   (4) ප්‍රත්තියාහාරම් (5) තයානම්

3. (1) පෝට්රිප්පහ්රොඩෛ (2) ඉරුපා ඉරුපහ්දු (3) කොඩික්කවි
   (4) උණ්මෛනෙරි විළක්කම් (5) සංගට්ප නිරාහරණම්

4. (1) දර්මම් (2) අර්ත්තම් (3) කාමම්
   (4) යෝගම් (5) මෝට්සම්

5. (1) තට්චිණකෛලාස පුරාණම් (2) කෛලායමාලෛ (3) කදිරමලෛප් පල්ලු
   (4) කණ්ණගි වළක්කුරෛ (5) පෙරියපුරාණ වසනම්

● අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැළපේ**. එම **නොගැළපෙන** යුගලය තෝරන්න.

6. (1) මැවීම - පන්හිඳ අල්ලාගෙන සිටින අත
   (2) රැකීම - මෝදගම් තබාගෙන සිටින අත
   (3) විනාශ කිරීම - අංකුශය තබාගෙන සිටින අත
   (4) ආශිර්වාද කිරීම - අමුද කලසම්
   (5) නොපෙන්වීම - කළයක් හැඩැති කුස

7. (1) සල විකුහම් - තැනින් තැනට ගෙන යා හැකි ය
   (2) මානසාරම් - මූර්ති කලාව
   (3) වාච්චිය මරායන් - සංගීත කලාවට අයත් ගෞරව නාමයක්
   (4) පන්ජ මරබූ - චිත්‍ර පොත
   (5) තරුමරාජරදම් - මූර්ති විශ්වකෝෂය

8. (1) කොඩි මරම් - පදි
   (2) කොඩි සීලෛ - පසු
   (3) පලිපීඩම් - විමුක්තිය
   (4) තරුප්පෛ කයිරු - පාසම්
   (5) කෝබුරම් - තුලලිංගම්

[දෙවැනි පිටුව බලන්න.

Department Of Examinations , Sri Lanka

9. (1) අයමාත්මා බ්‍රහ්මම් - මේ ලෝකය ම බ්‍රහ්මම් ය
(2) සත්‍යාන්නප් ප්‍රමදිතව්‍යම් - සත්‍යයෙන් ඈත් නොවිය යුතු ය
(3) දර්මාත්නප් ප්‍රමදිතව්‍යම් - ධර්මයෙන් බැහැර නොවිය යුතු ය
(4) සත්‍යම් වද - ඇත්ත කතා කරන්න
(5) දර්මම් සර - ධර්ම මාර්ගයේ ජීවත් වන්න

10. (1) තිරුමූලර් - තිරුකයිලාස පෙළපතෙන් පැමිණි අයෙකි
(2) කඩෙයිට් ස්වාමිහල් - මුත්තියානන්දර් යන තීක්ෂා නම ඇති තැනැත්තෙකි
(3) සිත්තානෛක්කුට්ටි ස්වාමිහල් - පෙරියානෛක්කුට්ටි ස්වාමිහල් වෙතින් ආශිර්වාද ලබාගත් තැනැත්තා
(4) සිවයෝග ස්වාමිහල් - තරුණ වියේ දී ගෝවින්දසාමි යන නම සහිත තැනැත්තා
(5) සෙල්ලප්පා ස්වාමිහල් - තේරඩි තේසිහන් යැයි ප්‍රශංසා ලැබූ තැනැත්තා

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයේ '**අ**' තීරුව සහ '**ආ**' තීරුව යටතේ කරුණු කිහිපයක් දී ඇත. '**ආ**' තීරුවේ ඒවා '**අ**' තීරුවට අනුව ගළපා ඇති වරණය තෝරන්න.

**11.**

| අ | ආ |
|---|---|
| (i) ආගමම් | A - අවදි දහ අට |
| (ii) වෛෂ්ණව ආගමංගල් | B - කාණ්ඩංගල් හත |
| (iii) සාක්ත ආගමංගල් | C - අතීතයේ සිට පැවත එන දැනුම |
| (iv) මහාභාරතය | D - වෛකානසම් |
| (v) රාමායණය | E - මහානිර්වාණ තන්ත්‍රය |

(1) A D E B C (2) C A B D E (3) C D E A B (4) C D E B A (5) C E D A B

**12.**

| අ | ආ |
|---|---|
| (i) වේද | A - කරගම් කව්ලින්ද කාවිරිප්පාවෙ |
| (ii) මණිමේහලෛ | B - 'කණනාම ත්වාමි කණබදි...' |
| (iii) තිරුඥානසම්බන්දර් | C - තිරුත්තොණ්ඩර් තිරුවන්දාදි |
| (iv) නම්බියාණ්ඩාර් නම්බි | D - 'අංගමුම් වේදමුම්...' |
| (v) ආදිසංකරර් | E - සණ්මද ප්‍රදිත්තාබගර් |

(1) A B C E D (2) A B D C E (3) B A D C E (4) B A E C D (5) B A E D C

**13.**

| අ | ආ |
|---|---|
| (i) තිරුක්කෝණේච්චරම් | A - තේසත්තුක් කෝයිල් |
| (ii) තිරුක්කේදීච්චරම් | B - රාම දෙවියන් වන්දනාමාන කළ ස්ථානය |
| (iii) කොක්කට්ච්චෝලෛ තාන්තෝන්රීච්චරම් | C - තිරුත්තම්බලේස්වරම් |
| (iv) මුන්නේච්චරම් | D - මහාදුවට්ටාපුරම් |
| (v) නගුලේච්චරම් | E - කුළක්කෝට්ටන් රජුගේ පූජනීය සේවය |

(1) A B E C D (2) D B C A E (3) E B A C D (4) E C A D B (5) E D A B C

**14.**

| අ | ආ |
|---|---|
| (i) සාංඛියම් | A - සමාදි |
| (ii) යෝගම් | B - සරීරසරීරි සම්බන්ධතාවය |
| (iii) අත්වෛදම් | C - ඉරුමෛම වාදම් |
| (iv) විසිට්ටාත්වෛදම් | D - පේදවාදම් |
| (v) තුවෛදම් | E - ඔරුමෛම වාදම් |

(1) A C B E D (2) A C E D B (3) C A D B E (4) C A E B D (5) E A D C B

**15.**

| අ | ආ |
|---|---|
| (i) විගට්පම් | A - මුරණ්ඩුකම |
| (ii) කට්පම් | B - තමන් අන් අයට සමාන නොවේ |
| (iii) අඟුර් | C - උඩඟුකම වැඩිවීම |
| (iv) මදම් | D - උපහාසාත්මක සිනාව |
| (v) නකෛ | E - සෑමවිට ම දුක්වීම |

(1) A B C D E (2) A B D C E (3) B A D C E (4) B A E C D (5) B C D E A



Department Of Examinations, Sri Lanka

- අංක **16** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වරණවලින් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

**16.** හින්දු තාරකා විද්‍යාත්මක සම්ප්‍රදායේ එකතුවක් වන 'පංචසිත්තාන්දිකෛ' නම් ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලද්දේ කවුද?

(1) ආරියපට්ටර් (2) වරාහමිහිරර් (3) සුස්රුදර්
(4) බාස්කරර් (5) සරහර්

**17.** ශිලාලේඛනවල 'ස්වස්ති ශ්‍රී' මගින් සඳහන් කරනු ලබන්නේ,

(1) 'දෙවියන්ට ප්‍රශංසා කරන්න' යනුවෙනි.
(2) 'සත්‍ය පවසන්න' යනුවෙනි.
(3) 'සුභ වේවා' යනුවෙනි.
(4) 'ධර්මය අනුගමනය කරන්න' යනුවෙනි.
(5) 'රජුට ප්‍රශංසා කරන්න' යනුවෙනි.

**18.** තමිල්නාඩුවේ සිරුතොන්ඩර් විසින් වන්දනා කරන ලද ගණ දෙවි ප්‍රතිමාව පිහිටා ඇති ස්ථානය වන්නේ,

(1) මාමල්ලපුරම් ය. (2) තන්ජාවූර් ය. (3) ශ්‍රීරංගම් ය.
(4) ගණබදීච්චරම් ය. (5) තිරුනාරෛයූර් ය.

**19.** 'තන්ද්‍ර සාස්ත්‍රම්' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන ග්‍රන්ථය වන්නේ,

(1) තිරුමන්දිරම් ය. (2) තේවාරම් ය. (3) සිවඥානපෝදම් ය.
(4) තිරුවායිමොළි ය. (5) කොන්රෛ වේන්දන් ය.

**20.** 'මුම්මුඩිච් චෝළ මණ්ඩලම්' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) අග්නිදිග ආසියාව ය. (2) ශ්‍රී ලංකාව ය. (3) තන්ජාවූර් ය.
(4) මදුරෛ ය. (5) උතුරු ඉන්දියාව ය.

**21.** 'සර්වමූලම්' යන තොගෙහෙ ග්‍රන්ථයේ කර්තෘවරයා කවුද?

(1) මත්තුවර් ය. (2) රාමානුජර් ය. (3) සංගරර් ය.
(4) කෞඩපාදර් ය. (5) මෙයිකණ්ඩාර් ය.

**22.** "විරුම්බුම් සරියෛ මුදල් මෙය්ඥානම් නාන්ගුම් අරුම්බු මලර් කායිකනි පෝලන්රෝ පරාපරමේ" යැයි ගායනා කළේ,

(1) අබිරාමිපට්ටර් ය. (2) කුමරකුරුපරර් ය. (3) අරුණගිරිනාදර් ය.
(4) තායුමානවර් ය. (5) සිවප්ප්‍රකාසර් ය.

**23.** සූර්යයා ධනු රාශියේ සිට මකර රාශියට සංක්‍රමණය වන දිනයේ දී සමරනු ලබන උත්සවය වන්නේ,

(1) සිත්තිරෛ අලුත් අවුරුද්ද ය. (2) නවරාත්‍රී ය. (3) තෛපොංගල් ය.
(4) දීපාවලී ය. (5) සිවරාත්‍රී ය.

**24.** ඉන්දියානු වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලබන්නේ,

(1) ආත්තිරේයර් ය. (2) සරහර් ය. (3) තන්වන්දිරි ය.
(4) සුස්රුදර් ය. (5) වරාහමිහිරර් ය.

**25.** "විමුක්තිය මා සමග නතර වේවි. ඊට වඩා සියලු දෙනා ම සතුටුවන ලෙස සේවය කිරීමෙන් ලැබෙන සතුට අසමසමයි" යනුවෙන් පැවසුවේ,

(1) ආරුමුගනාවලර් ය. (2) විවේකානන්දර් ය. (3) රාමක්‍රිෂ්ණර් ය.
(4) විපුලානන්දර් ය. (5) අරුණාසල තේසිකර් ය.

**26.** "මට තුන් ලෝකේ ම ඉටු කිරීමට යුතුකම් හෝ අවශ්‍යතා කිසිවක් නොමැත. කෙසේ වෙතත් මම ක්‍රියා කරමින් සිටිමි" යන භගවත් ගීතාවේ ප්‍රකාශය මගින් පිළිඹිබු කරනු ලබන්නේ,

(1) පරාර්ථකාමී සේවය ය. (2) දෙවියන් පිළිබඳව ඇති ගැඹුරු භක්තිය ය.
(3) නිරුත්තියාසනම් ය. (4) කාමික කර්මම් ය.
(5) ප්‍රකිරුදි ය.

**27.** පංචයක්ඥම්වල පට්ටි පොංගල් සඳහා සුදුසු වන්නේ කුමක් ද?

(1) බ්‍රහ්මයක්ඥ (2) දේවයක්ඥ (3) පිදිර්යක්ඥ
(4) භූතයක්ඥ (5) මානිඩයක්ඥ

Department Of Examinations, Sri Lanka

[හතරවැනි පිටුව බලන්න.

**28.** 'කෝයිට් පුරාණම්' යන ග්‍රන්ථයේ කර්තෘවරයා වන්නේ,

(1) අරුණන්දි සිවාචාරියාර් ය.
(2) උමාපති සිවාචාරියාර් ය.
(3) මරෛඥාන සම්බන්දර් ය.
(4) වල්ළලාර් ය.
(5) මෙය්කණ්ඩ දේවර් ය.

**29.** පිළිමයක ශරීර කොටස්වලින් කොටසක් පමණක් පෙනෙන අයුරින් කැටයම් කරනු ලබන මූර්තිය වන්නේ,

(1) සල හැඩතල ය.
(2) සලාසල හැඩතල ය.
(3) උන්නත (emboss) ප්‍රතිමා ය.
(4) සම්පූර්ණ හැඩතල මූර්ති ය.
(5) ලෝකඩ මූර්ති ය.

**30.** හින්දු වෛද්‍ය විද්‍යාවේ 'ත්‍රිධාතු' ලෙස හඳුන්වනු ලබන්නේ මොනවා ද?

(1) වාදම්, පිත්තම් සහ කබම් ය.
(2) මූප්පු, පිණි සහ සාක්කාඩු ය.
(3) මනම්, වාක්කු සහ කායම් ය.
(4) ආණවම්, කන්මම් සහ මායෛ ය.
(5) පායුරු, පාණි සහ උපත්තම් ය.

Department Of Examinations , Sri Lanka

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළව කිසියම් මාතෘකාවක් යටතේ ප්‍රකාශ/කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් දී ඇති මාතෘකාවට **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

**31. තිරුප්පාණාල්වාර්**

(1) ආල්වාර්ලා දොළොස්දෙනාගෙන් කෙනෙක් ය.
(2) පාණර් සම්ප්‍රදායේ බිහි වූවෙකි.
(3) ශ්‍රී වෛෂ්ණව කුලපති ලෙස ප්‍රශංසාවට ලක්වන්නෙකි.
(4) ශ්‍රී රංගනාදර්ට ප්‍රශස්ති ගායනා කර වෛෂ්ණව සේවයේ යෙදුනු අයෙකි.
(5) 'අමලනාදිප්‍රාන්' යන ප්‍රබන්ධය ගායනා කළ තැනැත්තා ය.

**32. තෙන් මෝඩි කූතුවේ වේශ නිරූපණය**

(1) පිරිමින් සඳහා ඇති ඔටුන්න මල් ඔටුන්න වේ.
(2) ඇඳුම් කරප්පු ඇඳුම් වේ.
(3) පාදවල කිංකිණි පැළඳ සිටී.
(4) පිරිමි කාන්තාවන් ලෙස සැරසී සිටියි.
(5) සිරුර පුරා සුදු පැහැති තීන්ත ආලේප කර ගෙන සිටී.

**33. 'අප්පිරතක්සිත්ති' යන දර්ශනය**

(1) විශ්වයේ (ප්‍රපඤ්ච) පැවැත්ම සඳහා දෙවියන්ගේ අවශ්‍යතාවය අවධාරණය කරයි.
(2) ආත්මයන් සහ ලෝකය දෙවියන්ගෙන් වෙන් කළ නොහැකි කොටස් යැයි සඳහන් කරයි.
(3) ආත්මයන්ගේ පැවැත්මට ඊශ්වර දෙවියන් හේතු වන බව සඳහන් කරයි.
(4) දෙවියන් හැර අන් කිසිවක් සත්‍ය නොවන බව සඳහන් කරයි.
(5) ආත්මයන් දෙවියන්ගෙන් වෙන් කළ නොහැකි කොටස් යැයි සඳහන් කරයි.

**34. සෛව සිද්ධාන්ත දර්ශනය**

(1) ත්‍රිත්වයේ (මුප්පොරුල්) සත්‍යතාව පිළිබඳ පැහැදිලි කරයි.
(2) අසීමිත දැනුම පැහැදිලි කරයි.
(3) ආත්මය හමුවන ඕනෑ ම ස්වභාවයකට අනුගත වේ යැයි පැහැදිලි කරයි.
(4) ප්‍රමාණංගල් තුනකින් සමන්විත වේ.
(5) කන්මම්හි ක්‍රියාවන් හතක් බව සඳහන් කරයි.

**35. ශිවරාත්‍රී උපවාසය**

(1) ශිව දෙවියන්ට සතුට ගෙන දෙන රාත්‍රිය ලෙස ද අර්ථකථනය කෙරේ.
(2) මහා ශිවරාත්‍රිය හැර තව ශිවරාත්‍රි වර්ග පහක් ඇත.
(3) මහා ශිවරාත්‍රිය සමරනු ලබන්නේ පෙබරවාරි මාසයේ ක්‍රිෂ්ණපක්ෂ සදුර්තසි තිදියේ දී ය.
(4) ශිවරාත්‍රියේ මහිමය පිළිබඳ කන්ද පුරාණම්හි සඳහන් වේ.
(5) සුර අසුරයන් විසින් පාට්කඩල් නම් සාගරය කැළඹීමේ දේව ඉතිහාසය හා සම්බන්ධ දෙයකි.

[පස්වැනි පිටුව බලන්න.

- පහත A සිට J දක්වා දී ඇති වචන අතුරෙන් දෙකක් විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන, අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

| A<br>ආත්තිරේයර් | B<br>සෙන්නාප්පෝදහර් | C<br>යාල්නූල් | D<br>කෞඩපාදර් | E<br>පෝසරාස පණ්ඩිතර් |
|---|---|---|---|---|
| F<br>මාණ්ඩූක්කිය කාරිගෛ | G<br>පරිමේලළහර් | H<br>සරහසම්හිතෛ | I<br>මහාලක්ෂ්මි තෝත්‍රම් | J<br>සරසෝදි මාලෛ |

**36.** ස්වාමි විපුලානන්දර් හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) CA (2) CB (3) CI (4) DJ (5) FI

**37.** ශ්‍රී ලංකාවේ ආර්ය චක්‍රවර්ති යුගය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) AJ (2) CJ (3) EG (4) EH (5) EJ

**38.** ආයුර්වේද සම්ප්‍රදාය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) AB (2) AH (3) AJ (4) BH (5) EH

**39.** අත්වෛද වේදාන්තය හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) BF (2) DF (3) DH (4) DJ (5) EF

**40.** තිරුක්කුරල් හා සම්බන්ධ යුගලය කුමක් ද?
(1) AB (2) BG (3) BJ (4) GH (5) GJ

- අංක **41** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. ඒවායින් **මාතෘකාවට වඩාත් ම ගැළපෙන** කරුණ තෝරන්න.

**41. කාන්චි කෛලාසනාදර් කෝවිලෙහි වපුහය**
(1) රාජසිම්මන් විසින් ගොඩනගන ලදී.
(2) ද්‍රවිඩ ගෘහ නිර්මාණ ශිල්පයේ ප්‍රධාන ලක්ෂණවලින් සමන්විත ය.
(3) ප්‍රධාන දේව කුටියේ ස්තර දාසයකින් යුත් ලිංගයක් ඇත.
(4) විමානය තට්ටු හතරකින් යුක්ත ය.
(5) සූට්රාලෙ මණ්ඩපයේ සිංහ රූප කැටයම් කර ඇත.

**42. "ආවුරිත්තුත් තින්රුළලුම් පුලෛයරේනුම්..."**
(1) තිරුනාවුක්කරසර් විසින් ගායනා කරන ලදී.
(2) තිරුනාවුක්කරසර් ශිව දෙවියන් කෙරෙහි දැක්වූ භක්තිය පිළිඹිබු කරයි.
(3) සමාජ සමගිය පිළිබඳ ආකල්පය වර්ධනය කරයි.
(4) දාර්ශනික සිතුවිලි උත්තේජනය කරයි.
(5) ශිව දෙවියන් වන්දනා කිරීමේ ක්‍රම විස්තර කරයි.

**43. තුලසි රාමායණය**
(1) රාම වීරයකු ලෙස සලකා රචනා කරන ලදී.
(2) හින්දි බසින් තුලසිදාසර් විසින් රචනා කරන ලදී.
(3) හින්දු ධර්මය සහ මානව වටිනාකම් පදනම් කරගෙන ඇත.
(4) විෂ්ණු දේව අවතාරයේ විශිෂ්ටත්වය පිළිබඳ සඳහන් කර ඇත.
(5) හින්දු භක්තිකයන්ගේ කලාවෙහි වර්ධනයට පාදක විය.

**44. හින්දු මාධ්‍ය ප්‍රභේදවල සාම්ප්‍රදායික මාධ්‍ය මෙවලම්**
(1) එක් අයකුගේ සංස්කෘතිය තව අයකු තේරුම් ගැනීමට උපකාරී වේ.
(2) ආගමික සහභාගීත්වය වැඩි කරයි.
(3) පුස්කොළ සහ ඇමතුම් පුස්කොළ මගින් තොරතුරු ලබා දෙයි.
(4) නමස්කාර ක්‍රම පිළිබඳ අන් අය දැනුවත් කරයි.
(5) සුබ මුහුර්තයන්හි දී ක්‍රියාවන්හි නිරතවීමට උපකාරී වේ.

Department Of Examinations , Sri Lanka

**45. හින්දු ආගමේ ජ්‍යොතිෂ්‍යයේ වැදගත්කම**

(1) වේදාංගංගල්වලින් එකකි.
(2) අදර්ව වේදය මගින් ජ්‍යොතිෂ්‍යය පිළිබඳ දැනගත හැකි ය.
(3) සූර්ය වර්ෂ ගණනය කිරීම ජ්‍යොතිෂ්‍ය ශාස්ත්‍රයෙහි ඇතුළත් වේ.
(4) හින්දු විද්‍යාත්මක කලාවන්ගෙන් එකකි.
(5) හින්දු භක්තිකයන්ගේ ජීවන චාරිත්‍ර සඳහා පදනම් වේ.

**46. හින්දු වෛද්‍ය විද්‍යාවේ විශේෂත්වය**

(1) ඍග් වේදයෙහි ඕෂධී සූක්තය වාත, පිත සහ කප පිළිබඳ දැනුම හා සම්බන්ධ වේ.
(2) හින්දු වෛද්‍ය ඉතිහාසයේ අදර්ව වේදයෙහි ජේසජානි සහ ආයුෂ්ජානි සූක්ත වැදගත් වේ.
(3) හින්දු වෛද්‍ය විද්‍යාව ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික තත්ත්ව මත ක්‍රියාත්මක වේ.
(4) පල්ලව ශිලා ලේඛන වෛද්‍යවරුන්ට ලබා දුන් සහනාධාර ඉඩම් 'මරුත්තුවපේරු' ලෙස සඳහන් කරයි.
(5) කම්බරාමායණයේ ඖෂධ වර්ග සහ වෛද්‍යවරුන් පිළිබඳ සඳහන් වේ.

**47. නල්වළි ග්‍රන්ථය**

(1) මිනිසාට යහපැවැත්ම පිරි ජීවිතයක් ගත කිරීමට මඟ පෙන්වයි.
(2) ගණ දෙවියන් කඩවුල් වාළ්ත්තුහි දී ප්‍රශංසා කරනු ලබයි.
(3) අව්වෛයාර් විසින් රචනා කරන ලදී.
(4) ශෛව ආගම හා සම්බන්ධ පදනම් වූ දාර්ශනික අදහස් ඇතුළත් ය.
(5) චෝළ යුගයේ දී බිහිවිය.

**48. ශ්‍රී ලංකා ඉතිහාසයේ කන්නගී වන්දනාව**

(1) මඩකලපුවේ කාන්තා දෙවිවරුන් අතර ශ්‍රේෂ්ඨතම දේවතාවිය ලෙස වන්දනාමාන කරනු ලබයි.
(2) කන්නගි ශිව ශක්තිගේ ආකාරයක් ලෙස සලකනු ලබයි.
(3) ශ්‍රී ලංකාවේ කන්නගී වන්දනාව ගජබාහු රජු විසින් ආරම්භ කරන ලදී.
(4) වට්රාපලෙහි කන්නගී දේවතාවියට වන්දනාමාන සිදුකරනු ලබයි.
(5) ශ්‍රී ලංකාවේ බෞද්ධයන් සහ හින්දු භක්තිකයන් කන්නගී වන්දනාමාන කරනු ලබයි.

**49. වේදයුගයේ වන්දනාව**

(1) යාග පූජාවලට ප්‍රමුඛත්වය දෙන ලදී.
(2) මිනිස් ස්වරූපයෙන් දෙවිවරුන් විස්තර කර ඇත.
(3) සංගීතය තුළින් වන්දනාමානයට ප්‍රමුඛත්වය ලබා දී ඇත.
(4) එක් දෙවියකුට බොහෝ නම් ලබා දෙමින් පූජා කටයුතුවල නිරත වුණි.
(5) ස්වභාවධර්ම වන්දනාවට ප්‍රමුඛත්වය දෙන ලදී.

**50. ඉන්දු නිම්නය සහ ශෛව ආගම**

(1) සූර්ය වන්දනාවට අදාළ සාක්ෂි ලැබී ඇත.
(2) දෙවියන්ට නිවේදන කරන ක්‍රමයක් පැවතුණි.
(3) ලිංග හැඩැති කේතුවාකාර ගල් සොයා ගෙන ඇත.
(4) නාග වන්දනාවට ප්‍රමුඛත්වය දුන් මැටි සුර සොයාගෙන ඇත.
(5) මව් දේවතා වන්දනාව පැවති බවට සාක්ෂි සොයාගෙන ඇත.

* * *

Department Of Examinations , Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

හින්දු ධර්මය II
இந்து சமயம் II
Hinduism II

42 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

✳ **I කොටසෙන්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසෙන්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (අ) 'උපනිෂද්' යන්නෙහි අර්ථය සඳහන් කරන්න. (ලකුණු 02යි)

   (ආ) උපනිෂද් **හතරෙහි** නම් සඳහන් කරන්න. (ලකුණු 04යි)

   (ඉ) උපනිෂද්හි සඳහන් වන පරිදි බ්‍රහ්මයේ ගති ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

   (ඊ) ආත්මය පිළිබඳ උපනිෂද්හි සඳහන් වන්නේ කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 08යි)

2. (අ) 'පණ්ඩිගෛ' (උත්සවය) යන්නෙහි අර්ථය දක්වන්න. (ලකුණු 02යි)

   (ආ) පණ්ඩිගෛ **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

   (ඉ) තෛපොංගල් උත්සවයෙහි සුවිශේෂී ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07යි)

   (ඊ) උත්සව මානව සංවර්ධනය ප්‍රවර්ධනය කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 08යි)

3. (අ) 'අරම්' යන්නෙහි අර්ථය සඳහන් කරන්න. (ලකුණු 02යි)

   (ආ) ධර්ම ශාස්ත්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 04යි)

   (ඉ) භගවත් ගීතාවේ සඳහන් අරම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

   (ඊ) හින්දු ආගමිකයන්ගේ පුරුෂාර්ථ න්‍යායේ වැදගත් ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 08යි)



Department Of Examinations , Sri Lanka

## II කොටස

**4.** පහත කරුණු මත පදනම්ව හින්දු දාර්ශනික සම්ප්‍රදාය තුළ ද්වෛත වේදාන්තයට ලැබෙන වැදගත්කම පැහැදිලි කරන්න.

(අ) 'ද්වෛදම්' හි අර්ථය (ලකුණු 03යි)

(ආ) භේදංගල් වර්ග පහක් (ලකුණු 05යි)

(ඉ) ඊශ්වර දෙවියන් පිළිබඳ ප්‍රතිපත්තිය (ලකුණු 06යි)

(ඊ) ජීව ප්‍රතිපත්තිය (කොල්කෛ) (ලකුණු 06යි)

**5.** පහත සඳහන් මාතෘකා මගින් ශෛව සිද්ධාන්තය පවසන මූලික මූලධර්ම පිළිබඳ චින්තන විස්තර කරන්න.

(අ) පදිගේ සත්‍යය

(ආ) පදිගේ ලක්ෂණ

(ඉ) පසු පිළිබඳ අර්ථකථනය

(ඊ) ආත්ම විමුක්තිය (ලකුණු 05 × 4 = 20 යි)

**6.** පහත සඳහන් කලාවන්ට ප්‍රමුඛත්වය දෙමින් ජන කලා සම්ප්‍රදායේ සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

(අ) කූත්තු

(ආ) කාවඩි (ලකුණු 10 × 2 = 20 යි)

**7.** පහත සඳහන් සාන්තුවරයන් හින්දු ආගමේ දියුණුවට කළ දායකත්වය පැහැදිලි කරන්න.

(අ) තිරුනාවුක්කරසු නායනාර්

(ආ) සිවයෝග සුවාමිහල් (ලකුණු 10 × 2 = 20 යි)

**8.** ශ්‍රී ලංකාවේ හින්දු ආගම වර්ධනය සඳහා ජනමාධ්‍යයන්හි කාර්යභාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 20යි)

* * *

Department Of Examinations , Sri Lanka